



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
චන්දන රෝහණ විතානාච්චි

# නිදහස් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා රජරට පැරණි වාරි කර්මාන්තයෙන් ලබාගත හැකි ආදර්ශය

ශ්‍රී ලංකාවේ මූල ඓතිහාසික අවධියේ ස්වදේශික ජනතාව මෙන් ම ජනාවාස පිහිටුවා ගත් ඉන්දීය සංක්‍රමණිකයින් ද ඒ සඳහා වඩාත් යෝග්‍ය භූමිය ලෙස සලකා ඇත්තේ වියළි කලාපීය ප්‍රදේශය යි. තම කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු භෞතික හා ස්වභාවික සම්පත් මෙම ප්‍රදේශයෙහි පිහිටා තිබීම ඊට බල පෑ ප්‍රධානතම සාධකය විය. ප්‍රදේශයේ පවතින විශේෂත්වය වන්නේ නිරන්තර වැසි නොලැබීම ය. මේ නිසා වසරේ වැඩි කාලයක් මෙම ප්‍රදේශ ඔස්සේ ගලායන ගංගා, ඇළ, දොළ වියළි ස්වභාවයක් උසුලයි. එයට හේතු වී ඇත්තේ මෙම කලාපයේ පවතින දීර්ඝ කාලීන නියං සමය යි. අතීතයේ සිට ම ප්‍රදේශයේ පැවති ජල හිඟතාව වාරි කර්මාන්තයන් ඉදිවීම කෙරෙහි බල පෑ ප්‍රධානතම හේතුව විය. නිරන්තර වැසි නො ලැබීම ත්, භූගත ජල මට්ටම වඩාත් ගැඹුරින් පිහිටා තිබීම ත් හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවලට මෙන් ම අනෙකුත් අවශ්‍යතාවන් සඳහා ද මෙම කලාපයේ ජලය සීමිත විය. මේ හේතුවෙන් වියළි කලාපීය ප්‍රදේශවල වාසය කරන ජනතාවට කෘෂිකාර්මික හා අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය කරන ජලය රැස් කර තබාගැනීම ඉතාමත් වැදගත් විය.

වියළි කාල ගුණයක් සහිත වූ අවස්ථාවක වී ගොවිතැන සඳහා කෘත්‍රිම ජල සම්පාදනයෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකි බව අත්දැකීමෙන් දත් පැරණි ජනතාවට දේශගුණික දුෂ්කරතාව ජය ගැනීම පිණිස කලාපයේ හූ පිහිටීම බෙහෙවින් ප්‍රයෝජනවත් විය. ශ්‍රී ලංකාවේ ස්වභාවික ගංගා නිම්න 103 ක් තිබෙන අතර මින් ගංගා නිම්න 83ක් ම පිහිටා ඇත්තේ වියළි කලාපයේ ය. එසේ වුව ද ඒ අතරින් වාර්ෂික ව නිශ්චිත ජල ප්‍රමාණයක් දරා සිටින්නේ මධ්‍ය කඳුකරයෙන් ඇරඹී වියළි කලාපය ඔස්සේ මුහුදට සේන්දු වන මහවැලි, වළවේ, මැණික් යන ගංගා සහ කිරිඳි හා කුඹුක්කන් ඔය පමණි. අනෙකුත් ජල මාර්ග අතරින් මල්වතු ඔය, මී ඔය, දැදුරු ඔය, යාන් ඔය හා කලා ඔය වැනි ජල මාර්ග කිහිපයක් ඉතා ස්වල්ප ජල ප්‍රමාණයක් වියළි කාලයේ දී දරන අතර අනෙකුත් බොහොමයක් ජල මාර්ග සම්පූර්ණයෙන් ම සිඳී යයි. කෙසේ වෙතත් වියළි කලාපය ඔස්සේ ගලන ජල මාර්ගවලින් වාර්ෂිකව අක්කර අඩි 20.661000 ක පමණ ජල ප්‍රමාණයක් මුහුදට එකතු වේ.

එසේ වුව ද වී වගාවට අවශ්‍ය ජලය උවමනා විටක සම්පාදනය කරගැනීම මෙම කලාපයේ පැවති ප්‍රධාන අභියෝගය විය. මේ වන විට මෙම ප්‍රදේශයේ කෙත්බිම්වලින් වැඩි කොටසකට ජලය සැපයෙන්නට ඇත්තේ ගම්වල කුඩා වැව්වලට වර්ෂාවෙන් රැස්කරගත් ජලය මගිනි. බොහෝ කෙත්බිම් වියළි කාලයේ දී වගා නොකරන්නට ඇත. වඩාත් සමතලා නො වූ මෙම භූමි ප්‍රදේශයේ පවතින අභියෝගය ජය ගැනීම සඳහා මනා වූ පරිපාලනයක් සහිත වාරි මාර්ග පද්ධතියක අවශ්‍යතාව වටහා ගත් දේශපාලන අධිකාරිය දියුණු වාරි පද්ධතියක් බිහි කරලී ය. මේ සඳහා මුලින් ම ගම් වැව් හෙවත් කුඩා වැව් ඉදි කෙරුණු අතර, පසුව ජනගහනය ක්‍රමයෙන් අධික වත් ම වඩාත් දියුණු වාරි ක්‍රම තැනීම කෙරෙහි අවධානය යොමු විය. එහෙයින් ගංගාවල් හා ඔයවල් හරස් කර අමුණු තනා ජලය හැරවීම, එම ජලය ඇළ මාර්ග ඔස්සේ විශාල වැව් කරා රැගෙන යාම වැනි කටයුතු ක්‍රමයෙන් ආරම්භ විය.

## විමර්ශනය

ශ්‍රී ලංකාවේ වාසය කළ ස්වදේශික ජනතාව සහ උතුරු ඉන්දියාවේ සිට දකුණු ඉන්දියාව හා සාගර කලාපය ඔස්සේ මෙරටට සංක්‍රමණය වූ ජන කණ්ඩායම් වී ගොවිතැන ප්‍රධාන කොට ගත් කෘෂි අර්ථ ක්‍රමයක් කෙරෙහි නැඹුරු වූ පිරිසක් විය. ඒ අනුව ඔවුන් මෙරට වියළි තැනිතලා ප්‍රදේශවල පිහිටීම මත පදනම් ව සුළු වාරි කර්මාන්ත සඳහා යොමු වූ බව පැහැදිලි ය. ගංගා නිම්නවල ජනාවාස පිහිටුවාගත් මූල ඓතිහාසික අවධියේ ජනතාව

අතර ආදිතමයින් තාවකාලික මැටි වේලි ආදිය යොදමින් ජල මාර්ග හරස්කර කෘෂි බිම් සඳහා ජලය ලබා ගන්නට ඇති බව සිතිය හැකි වේ. එහෙත් ක්‍රමයෙන් ජනගහනය අධිකවීම තුළ එම ජල සම්පාදන ක්‍රම ප්‍රමාණවත් නො වූ හෙයින් තැනිතලා භූමියේ තිබෙන වැටි හා උස් බිම් උපයෝගී කර ගනිමින් කුඩා වැව් තනා අහස් දිය රැස් කර ගෙන කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගන්නට ඇත.

කෘෂි කර්මාන්තයට යෝග්‍ය නො වූ ජල පහසුකම්වලින් අඩු ප්‍රදේශවලින් ලද අත්දැකීම් සමග ක්‍රමයෙන් රට තුළට ගමන් කළ ඉන්දීය ජන සංක්‍රමණිකයින් වෙරළට ආසන්න සරුසාර කලාපයේ ත් වියළි කලාපීය තැනිතලා ප්‍රදේශවලත් ස්වකීය ජනාවාස පිහිටුවා ගෙන තිබේ. පණ්ඩුකාභය අනුරාධ ග්‍රාමය තවදුරටත් සංවිධානාත්මක නගරයක් බවට පත්කරන ලද්දේ වියළි කලාපීය ගංගා නිම්නබද ප්‍රදේශවල පවතින වැදගත්කම අවබෝධ කරගෙන බව පැහැදිලි ය.

ස්වදේශික ජනතාව හා ඉන්දීය ජන සංක්‍රමණිකයින් තම ජනාවාස නිර්මාණය කර ගෙන ඇත්තේ සාමූහික රටාවක් තුළ බව සිතිය හැකි ය. මුල් කාලීන වියළි කලාපීය ජනාවාස බිහිවීම කෙරෙහි බල පෑ ප්‍රධාන වාරි සාධක දෙකක් හඳුනා ගත හැකි ය.

1. වැසි ජලය ඉතා සරල ලෙස නිර්මාණය කරන ලද තඩාගයක රඳවා ගෙන එම ජලය ප්‍රාථමික ඇළ මාර්ග ඔස්සේ අවශ්‍යතාවන් සඳහා ප්‍රයෝජනයට ගැනීම

2. වසර පුරා ජලය රැගෙන යන ජල ප්‍රමාණය වේගවත් නො වූ ජල මාර්ග ප්‍රාථමික අයුරින් ගල් පර්වත දැව ආදිය දමා හරස්කොට එම ජලය කුඩා ඇළ මාර්ග ඔස්සේ අවශ්‍යතාවන් සඳහා ලබාගැනීම

මුල් කාලීන ජනාවාසකරණයෙහි ලා ග්‍රාමීය වැව්වල දායකත්වය ඉතා ඉහළ මට්ටමක පැවතී තිබේ. පූර්ව බ්‍රාහ්මීය සෙල්ලිපිවල සඳහන් තොරතුරු අනුව පැහැදිලි වන්නේ ඇතැම් ගම්මාන වැව් පදනම් කරගෙන බිහි වී තිබෙන බව යි (IC 1970 : 25, 112, 168, 1130). පරුමකවරුන් විසින් නායකත්වය දෙන ලද මෙවැනි ගම්මාන ආශ්‍රිත ව තුනී ජන විසිරීමක් පවතින්නට ඇති බැවින් කුඩා ග්‍රාමීය වැව් ඇසුරින් කරන ලද කෘෂි කර්මාන්තය ඔවුන්ට ප්‍රමාණවත් වන්නට ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා උතුරු පළාතේ පමණක් මෙවැනි

කුඩා ග්‍රාමීය වැව් 11500 පමණ තිබූ බව 1904 දී කරන ලද සමීක්ෂණයකින් අනාවරණය වී තිබේ (බ්‍රෝහියර්, 2007: 19). එවැනි ග්‍රාමීය වැව් ආශ්‍රිත ජනාවාස බිහි වූ බවට පැහැදිලි සාක්ෂි පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් ද අනාවරණය කර ගත හැකි ය. ක්‍රි.පූ. අවසන් සියවස් කිහිපය තුළ ඉදි කරන ලද වැව් ගණනාවක් වංසකථාවේ සඳහන්ව ඇත. අනුරාධ නම් ඇමතියා අනුරාධග්‍රාමය ඉදි කරන ලදැ යි සඳහන් වන වැව, මේ අතරින් වඩාත් පැරණි ම වාරි නිර්මාණය ලෙස සැලකේ (මව, පරි. පෙළ 11). පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය පිහිටුවීමේ දී ජයවාපී, අභයවාපී හා ගාමිණිවාපි නමින් වැව් තුනක් ඉදිකර තිබේ. (එම, පෙළ 83 සිට). ක්‍රි.පූ. 03 වන සියවසේ දී මහානාග උප රජු කරච්චවාපි නමින් වැවක් කරවා ඇත. (එම, පරි. 22 පෙළ 4). දුටුගැමුණු රජු (ක්‍රි.පූ. 161 -137) ගේ යෝධයකු වූ ලභියවසභ විසින් ද වැවක් කරවා තිබේ. (එම පරි. 23 පෙළ 92 - 4). සද්ධාතිස්ස (ක්‍රි.පූ. 137 - 119) කුමාරයා විසින් දීඝවාපී ප්‍රදේශයේ ද එවැනි වැව් ඉදිකරන්නට ඇත (එම පරි. 24 පෙළ 2 - 3). ග්‍රාමීය වැව් ජන ජීවිතයට සමීප සාධකයක් වූ බැවින් ක්‍රි.පූ. සමයේ දී ස්ථාන නාම සකස්වීම කෙරෙහි ද එය බල පා තිබේ.

දිවයිනේ වියළි කලාපය පුරා ව්‍යාප්ත ව තිබෙන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන අනුව එම ප්‍රදේශවල ජනාවාස පැතිරීම පිළිබඳ අදහසක් ඇති කර ගත හැකි වුව ද එම ජනාවාස පවතින්නට ඇත්තේ තුනී ජන විසිරීමක් සහිත ව බව සිතිය හැකි වේ. මේ හේතුවෙන් ග්‍රාමීය වැව් උපයෝගී කර ගෙන සිදු කරන ලද කෘෂි කර්මාන්තය ඔවුනට ප්‍රමාණවත් වන්නට ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා උතුරු පළාතේ පමණක් මෙවන් කුඩා ග්‍රාමීය වැව් 11200 ක් තිබූ බව 1904 දී කරන ලද සමීක්ෂණයකින් හෙළි වී තිබේ.

රටේ ආර්ථිකය සංවර්ධනය කිරීම රජුගේ වගකීම් අතරට එකතු වූ අතර එහි ප්‍රධාන අංශයක් වූ කෘෂි කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට රජු මැදිහත් වී තිබේ. දුටුගැමුණු කුමරු අනුරාධපුරය යටත් කර ගැනීමට පෙර රෝහණ දේශයේ සිට කාවන්තිස්ස රජු කෘෂි කර්මාන්තය දියුණු කිරීම සඳහා දුටුගැමුණු කුමරුගේ සොහොයුරු සද්ධාතිස්ස කුමරු මෙහෙයවීම මෙයට නිදසුනකි, සද්ධාතිස්ස රජු වැව් 12 ක් ඉදි කළ බව පූජාවලියේ සඳහන් වන අතර එතුමන් විසින් වැව් 18 ක් කරවූ බව රාජාවලිය සඳහන් කරයි. කෙසේ නමුත් මෙම වැව් ප්‍රමාණයෙන් විශාල නො වූ ඒවා බව පැහැදිලි ය. ක්‍රි.පූ. පළමුවන සියවසේ දී කුටකණ්ණතිස්ස රජු “දෙගම” නමින් ඇළක් කරවූ බව මීන්විල සෙල්ලිපියේ සඳහන් ව තිබේ. ඒ අනුව

පැහැදිලි වන්නේ මේ වන විට වැව්, අමුණු හා ඇළ මාර්ග තැනීම පාලකයින් විසින් මෙහෙයවීම ආරම්භ කර තිබූ බව යි.

ක්‍රි.පූ. පළමු වන සියවස අවසාන භාගය වන විට හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ එතෙක් පැවති ග්‍රාමීය වැව් සංකල්පය පරිවර්තනයකට ලක් වීම යි. ජනගහනය වර්ධනය වීම, නාගරීකරණය, වාණිජ කටයුතු දියුණු වීම වැනි හේතූන් මත නිෂ්පාදනයට වඩා පරිභෝජනය වැඩිවීම හේතුවෙන් කෘෂි නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමේ අවශ්‍යතාව ඇති විය. මීට අමතර ව ග්‍රාමීය වැව්වල පවතින දුර්වලතාවන් පිළිබඳ අත්දැකීම් මෙම පරිවර්තනයට හේතු වන්නට ඇත.

ක්‍රි.පූ. පළමු වන සියවස වන විට වියළි කලාපයේ සෑම ගමකට ම වැවක් තිබුණේ ය. එසේ වුව ද මේ කාලය තුළ ජල සම්පාදන ක්‍රම දෙකක් තිබුණු බවට සාක්ෂි හමු වී ඇත.

1. ජල මාර්ග හරහා ස්ථිර ලෙස ගලින් කළ කුඩා වේලි බැඳ හෝ දඬුවලින් හෝ මැටියෙන් හෝ වෙනත් ද්‍රව්‍යයන්ගෙන් හෝ වේලි බැඳ ජලය ඇළ මාර්ගවලට යොමු කර ප්‍රයෝජනයට ගැනීම.

2. පස්වැටි ඉදි කොට ඒවායේ රැස්වෙන ජලය ඊට පහළින් වූ කෘෂි බිම්වලට යොමුකිරීම,

ක්‍රි.ව 01 වන සියවසේ සිට සියවස් කිහිපයක් යන තෙක් රට තුළ ප්‍රබල ලෙස ඉස්මතු වූ දේශපාලන අර්බුද ඇති නො වී ය. මෙම යහපත් වාතාවරණය තුළ රටේ ජනගහනය ද ශීඝ්‍රයෙන් වර්ධනය වන්නට ඇත. රටේ ආර්ථික ක්ෂේත්‍රය ඇතුළු සංවර්ධන කටයුතුවලට රජුගේ බලපෑම හා දායකත්වය නො මඳ ව ලැබීම ආරම්භ වන්නේ මේ කාලයේ දී ය. වසභ රජුගේ කාලයේ දී ආරම්භ වූ මෙම තත්ත්වය මහසෙන් රජුගේ (274 - 301) කාලය වන විට උපරිම වශයෙන් වර්ධනය වී තිබුණු බව හඳුනා ගත හැකි ය. සියවස් කිහිපයක් පැවති මෙම සාමකාමී කාලය කෘෂි කර්මාන්තයේ වර්ධනයට උපරිම ලෙස දායක වී ඇත. වසරක් තුළ කන්න තුනක් වගා කිරීම, ධාන්‍ය වර්ග ආයෝජනයට ලක් කිරීම වැනි තොරතුරු ශිලා ලේඛන ඇසුරින් අනාවරණය වීම මෙකල පැවති සෞභාග්‍ය බවට නිදසුන කි. ඒ සඳහා බලපා ඇත්තේ මේ කාල සීමාව තුළ වාරි කර්මාන්තයේ ලද ශීඝ්‍ර වර්ධනය බව පැහැදිලි ය. වාරි ක්‍රම හා එහි පරිපාලනය සම්බන්ධ නීති රීති සමුදායක් හා

ජන සම්මත සම්ප්‍රදායක් මේ කාලයේ දී බිහි විය (බස්නායක, 2001:102). එහි ප්‍රතිඵලය වූයේ විශාල වාරි කර්මාන්තයේ නියැලීමට අවශ්‍ය බලතල රජුට හිමි වීම යි. එවැනි කාර්යයන් හි නිරත වූ පාලකයින් ජනතාවගේ ඇගයීමට මෙන් ම ඇදහීමට ත් පාත්‍ර වන්නේ මේ නිසා ය (මව, පරි. 37 පෙළ 50).

අනුරාධපුර රාජධානියේ මහා පරිමාණ වාරි කර්මාන්තයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ මහසෙන් රජු ය. ඒ වන විට වඩාත් දියුණු වී තිබුණු වාරි කර්මාන්තය පිළිබඳ දේශීය දැනුම මහසෙන් රජු මැනවින් ස්වකීය වාරි කර්මාන්ත සංවර්ධනය උදෙසා උපයෝගී කර ගත් බව පැහැදිලි වන්නේ එතුමන් විසින් කරවන ලද වාරි නිර්මාණ පරීක්ෂා කිරීමේදී ය. මොහු විසින් කරවන ලද වැව් ගණනාවක් ම මේ වන විට හඳුනාගෙන තිබේ (නිකොලස්, 1961. 295). මහසෙන් රජුගේ වාරි නිර්මාණ වල ස්ථානගත වීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට පැහැදිලි වන්නේ ලංකාවේ උතුරුමැද, බටහිර, නැගෙනහිර හා වයඹ ප්‍රදේශ ආශ්‍රිත වියළි කලාපය ඒ සඳහා කේන්ද්‍රගත වී තිබෙන බව යි.

ක්‍රි.ව 04 සියවසේ සිට ක්‍රි.ව 10 වන සියවස දක්වා වූ කාලය තුළ දිවයිනේ බොහෝ ප්‍රදේශවල රාජකීය අනුග්‍රහය මත වාරි කර්මාන්ත සිදු වූ බවට තොරතුරු වංශකථාවෙන් හමු වේ. කිත්සිරිමෙවන් රජු ( 308 - 328 ) වැව් දිය තහවුරු කළ බව මහාවංසයේ සඳහන් ව ඇත. (මව, පරි, 37 පෙළ 98). උපතිස්ස රජු ( 365 - 406 ) වාරි කර්මාන්තයේ දියුණුවට සැළකිය යුතු දායකත්වයක් සපයා දී තිබේ. (එම, පෙළ 185 - 6). උපතිස්ස රජුගෙන් පසු ඇති වූ වියවුල් සහගත ස්වභාවය හේතුවෙන් දශක කිහිපයක් යන තෙක් වාරි කර්මාන්තයේ වර්ධනයක් සිදු වී නොමැත. කෙසේ නමුත් ධාතුසේන රජු (455-473 ) විසින් යළි ඇති කරන ලද සාමකාමී වාතාවරණය තුළ වාරි කර්මාන්තයේ දියුණුව යළි ආරම්භ වී තිබේ. ඔහු විසින් වැව් 18 ක් කැරුණු බව සඳහන් වේ. මින් විශාලතම වාරි නිර්මාණය වන්නේ කලා වැව හා යෝධ වැව යි. ධාතුසේන රජුගේ වාරි නිර්මාණ ප්‍රධාන වශයෙන් අනුරාධපුරයෙන් වයඹ හා ගිණිකොණ දෙසට විහිදී තිබෙන බව හඳුනාගත හැකි ය.

ඉන්පසු දේශීය වාරි කර්මාන්තයේ දියුණුවට දායකත්වයක් දැක්වූයේ දෙවන මොග්ගල්ලාන රජු (531 - 551) ය. ඔහු විසින් කරන ලද වැව් අතර (එම, පරි. 40 පෙළ 61) මින් පත්තපාෂාණ වාපි යනු නාච්චදූව වැව ලෙසට ත්, ධන වාපිය පදවිය වැව ලෙසට ත් හඳුනා ගෙන ඇත. අනුරාධපුර නගරයේ පිහිටි නකර වව් හෙවත් නුවර වැව ද මෙම රජු විසින් ඉදිකරන්නට ඇති

බව හෝ ප්‍රතිසංස්කරණය කරන්නට ඇති බව විශ්වාස කෙරේ. පළමුවන අග්ගබෝධි රජු (571 - 604) ද මෙරට වාරි කර්මාන්තයේ දියුණුවට සුවිශේෂී දායකත්වයක් සපයා ඇත (එම පරි. 41 පෙළ 29 -35). මේ රජුගේ වැදගත් ම වාරි නිර්මාණයක් වන්නේ මහවැලි නදිය හරස්කොට මණිමේකලා බැම්ම හෙවත් මිණිපේ අමුණ කරවීම යි. දෙවන අග්ගබෝධි රජු (604 - 614) පැරණි වාරි නිර්මාණ ප්‍රතිසංස්කරණය කළ අතර ගංගාතට වාපි හෙවත් කන්තලේ වැව ද, ගිරිතලා වාපි හෙවත් ගිරිතලේ වැව ද කරවා තිබේ. (නිකොලස්, 1961. 298 හා මව. පරි. 41 පෙළ 68). ක්‍රි.ව 07 වන සියවස වන විට ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය ජාලයක් ලෙස ක්‍රියාත්මක වීම සිදු වී ඇත. විශේෂයෙන් ම ඇළ මාර්ග මඟින් අන්තර් නිම්න අතර සම්බන්ධතාව ඇති කිරීම නිසා අතිරේක ජල සම්පාදනය කිරීමෙන් වාරි මාර්ගවල කාර්යක්ෂමතාව ඉහළ මට්ටමක පැවති බව තහවුරු වේ (නිකොලස්. 1961. 299 -300, JRAS ( CB ) NS Vol. 1959. 57). ඒ අනුව වෙතත් ක්‍රි.ව 07 වන සියවස වන විට අනුරාධපුරයට අයත් වාරි කර්මාන්තයේ උච්චතම අවස්ථාව පිළිබිඹු කරන බව පැහැදිලි ය.

ක්‍රි.ව 08 - 09 සියවස් කාලය තුළ ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ පෙර රජවරුන් විසින් කරවන ලද වාරි මාර්ග යළි ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ තොරතුරු ය. (එම, පරි. 46 ( 48 ) පෙළ 8 -9 , 148 හා පරි. 51 පෙළ 72 -3). දෙවන උදය රජු ( 887 - 898 ) ද මෙරට වාරි කර්මාන්තය නගා සිටුවීමට කටයුතු කර තිබේ. වැව් විශාල කිරීම, අතිරේක ජලය වැව්වලට යොමු කිරීම වැනි කටයුතු එතුමන් විසින් සිදුකරන ලදී. (නිකොලස්, 1961. 301 -2). තුන් වන සේන රජු (938 - 946) විනාශයට පත් වැව් අමුණු රාශියක් ප්‍රතිසංස්කරණය කර තිබේ. පස්වන කාශ්‍යප රජුගේ (913 - 923) අනුරාධපුර පුවරු ලිපියෙන් අනාවරණය වන්නේ කුඹුරු වගා කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දෙමින් සාගත බිය දුරු කරන ලද බව යි (EZ, Vol අංක 4). සිව්වන මිහිඳු රජු (956 - 972) කැඩීගිය වැව් අමුණු ප්‍රතිසංස්කරණය කළ බව ඔහුගේ ජේතවනාරාම පුවරු ලිපියේ සඳහන්කර ඇත. (එම, අංක 20).

ක්‍රි.ව. 8 - 10 අතර කාලය තුළ දේශීය වාරි කර්මාන්තය සඳහා නව නිර්මාණ කිසිවක් එකතු වී නො මැත. ඇතැම් විට වියළි කලාපය පුරා ප්‍රමාණවත් වැව් අමුණු මේ වන විට නිර්මාණය වී තිබීම මේ සඳහා බලපාන්නට ඇත. තවද එම වාරිමාර්ග නිසි පරිදි ප්‍රයෝජනයට ගත්තා ද යන්න සැක මතුවේ. මෙම කාලය තුළ ඇති වූ දුර්භික්ෂ මෙම සුවිසල් වාරි කර්මාන්තය බිඳ වැටීම නිසා සිදු වූ බවට ද උපකල්පනය කළ හැකි ය. වාරි

මාර්ග පද්ධතිය බිඳ වැටීමට ස්වාභාවික හේතූන් මෙන්ම 10 වන සියවසේ මධ්‍ය භාගයේ සිදු වූ දකුණු ඉන්දීය ආක්‍රමණ ද බලපාන්නට ඇත. මෙවැනි නොසන්සුන්කාරී වාතාවරණය තුළ නිසි නඩත්තුවකට ලක් නො වූ වාරි නිර්මාණ වැඩි ප්‍රමාණයක් ස්වභාවික හේතූන් මත විනාශ වන්නට ඇති අතර ඇතැම් ඒවා ආක්‍රමණිකයින් විසින් විනාශ කර දමන්නට ඇත.

ක්‍රි.ව 993 දී සිදු වූ චෝල ආක්‍රමණය ත් සමග අනුරාධපුර රාජධානිය බිඳ වැටුණි. අනතුරුව පොළොන්නරුව අගනුවර කරගත් සොළීන් වසර 77 ක් පමණ මෙරට පාලනය කරන ලද අතර එය අවසන් කරන ලද්දේ ක්‍රි.ව 1070 දී පළමුවන විජයබාහු රජු ( 1055 - 1110 ) විසිනි. රාජ්‍යත්වය ස්ථාවර කර ගැනීමෙන් පසු ඔහු තම ප්‍රධාන කාර්යය ලෙස ඉටු කරන ලද්දේ වාරි මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු ය. (මව, පරි. 60 පෙළ 48 -54). වංසකථාවට අනුව පැහැදිලි වන්නේ පෙර රජවරුන් කරවන ලද විශාල වැව් ගණනාවක් ම මොහු විසින් ප්‍රතිසංස්කරණය කර තිබෙන බව යි.

දේශීය වාරි කර්මාන්තයේ ස්වර්ණමය අවධිය පළමු වන පරාක්‍රමබාහු රජුගේ ( 1153-1186 ) කාලයේ දී උදා වේ. ඔහු විසින් ප්‍රතිසංස්කරණය කැරුණු හා අලුතින් ඉදි කරන ලද වැව් හා ඇළ මාර්ග විශාල ප්‍රමාණයක් පිළිබඳ තොරතුරු වංසකථාවේ සඳහන් වේ. එසේ වුව ද එවැනි සුවිසල් කාර්යභාරයක් ඉටු කිරීම සඳහා ඔහුට අවශ්‍ය පදනම සකස් වූයේ පළමු ව දක්ඛිණ දේශයේ පාලකයා බවට පත්වීම හා එම කාලය තුළ ඔහු අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය යි. දක්ඛිණ දේශයේ කෘෂි කාර්මික කටයුතු දියුණු කිරීමට අදහස් කළ පරාක්‍රමබාහු රජු තම නිලධාරීන්ට උපදෙස් දී උනන්දු කරවා ඇත. (එම, පෙළ 7) විශේෂයෙන් ම ප්‍රදේශයේ පවතින වියළි දේශගුනික තත්ත්වය කෙරෙහි අවධානය යොමු කළ හෙතෙම දක්ඛිණ දේශයේ එක ම ප්‍රධාන ජල මාර්ගය වූ ජජ්ජර නදිය (දැදුරු ඔය) ආශ්‍රිත ව වාරිමාර්ග තැනීමට යොමුවිය. හෙතෙම දැදුරු ඔය ස්ථාන තුනකින් හරස්කර කොට්ඨබද්ද, සූකරනිජ්ජර හා දෝරදත්තික යන අමුණු කරවා ගොවිතැනට අවශ්‍ය ජල සම්පාදනයට පියවර ගෙන තිබේ. (එම, පෙළ 16 -38). “අහසින් වැටෙන එකදු දිය බිඳක් පවා මනුෂ්‍ය ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා නොයා යුතුය” යන ප්‍රකාශය පරාක්‍රමබාහු රජු විසින් කරන ලද්දේ දැදුරු ඔය ආශ්‍රිත වාරි කර්මාන්තයේ නියැලෙන අවස්ථාවේදී ය. (එම, පෙළ 11 -2). ප්‍රදේශය තුළ පිහිටි පුරාණ වැව් විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීමට ත් අලුතින් ඉදිකිරීමට ත් එතුමා යොමු වී ඇත. (එම පෙළ 43 -52) ඔහු විසින් දක්ඛිණ

දේශය තුළ ප්‍රතිසංස්කරණය කළ වැව් පිළිබඳ ලේඛනයක් නිකොලස් විසින් සකසා තිබේ. (නිකොලස්. 1959, 66 -70).

එතුමා අගරජු වීමෙන් පසු ව ද රටේ ආර්ථිකය දියුණු කිරීම සඳහා අනුගමනය කළ ප්‍රධානතම කාර්යය වූයේ කෘෂි කර්මාන්තය දියුණු කරලීමට කටයුතු කිරීම යි. ඒ සඳහා වාරි කර්මාන්තය නගා සිටුවීම පිණිස දැඩි කැප කිරීමක් පරාක්‍රමබාහු රජු විසින් සිදු කරනු ලැබ ඇත. එහෙත් එම ක්‍රියාවලිය පිළිබඳ මූලික සැළසුම් ඔහු විසින් සකස් කරන්නට ඇත්තේ දක්ඛිණ දේශයේ පාලකයා ව සිටි අවධියේ බව ඒවායේ සාර්ථකත්වය පිළිබඳ පිරික්සීමේදී පැහැදිලි වේ. චූලවංසයට අනුව, පෙර තිබුණු වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම ඔහු විසින් වැඩි වශයෙන් සිදු කරනු ලැබ ඇත. තම රාජ්‍ය කාලය තුළ අමුණු 165 ක්, ඇළ මාර්ග 3910 ක්, මහවැව් 163 ක් හා කුඩා වැව් 2376 ක් කරවන ලද හෝ ප්‍රතිසංස්කරණය කරන ලද බව චූලවංසයේ සඳහන් වේ. (එම පරි 79 පෙළ 24 -87) මෙය මෙරට රජ කෙනෙකු විසින් කරන ලද වැඩි ම වාරි නිර්මාණ ප්‍රමාණය ලෙස සැළකිය හැකි වේ. පරාක්‍රමබාහු රජු ප්‍රතිසංස්කරණය කරන ලද වාරි කර්මාන්ත ඇතුළත් ලේඛනයක් නිකොලස් විසින් සකස් කරනු ලැබ තිබේ. ( CHJ, 1954, 55-65 සිට, (නිකලොස්, 1959. 77 -80) චූලවංසයට අනුව පරාක්‍රමබාහු රජුගෙන් පසු මෙරට වාරි කර්මාන්තයේ දියුණුවට සම්බන්ධ වූ රජවරුන් කිසිවකු පිළිබඳ ව සඳහන් නො වේ.

එසේ වුව ද ශිලා ලේඛනවල සඳහන් තොරතුරු අනුව නිශ්ශංකමල්ල රජු ( 1187-1196 ) වැව් තැනීම හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතුවල නිරත වී ඇති බව සනාථ වේ. ( EZ Vol 14, 15, 17, 19, 20, 21, 22, 23, 24, 25, 29, 42) මෙම රජු විසින් ප්‍රධාන වශයෙන් සිදුකර ඇත්තේ මුල් කාලීන වැව් ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු ඒ සඳහා අලුත් නම් ආදේශ කිරීම යි (ල.වි.වි.ල.ඉ. 1972. 488). කෙසේ නමුත් ඔහුගේ පොළොන්නරුව කලාක්‍රීඩා විනෝද ගල් ආසන ලිපියේ හා ප්‍රීතිදාන මණ්ඩප ගිරි ලිපියේ සඳහන් " තුන් රජයෙහි බොහෝ කල් අපවත් මහ වැව් ඇළ අමුණු බන්දවා ඒ ඒ රට සුභික්ෂ කොටැ........." (EZ Vol අංක 20 -9) යන පාඨයෙන් පැහැදිලි වන්නේ නිශ්ශංකමල්ල රජු විසින් වාරිමාර්ග රාශියක් ම ප්‍රතිසංස්කරණය කරන ලද බව යි.

නිශ්ශංකමල්ල රජුගෙන් පසු වාරි කර්මාන්තයන් ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් අවසන් වරට වාර්තා වන්නේ කල්‍යාණවතී රැජිණ (1202-8) ගේ කාලයේ දී ය. දැදුරු ඔය ආශ්‍රිත ව ඉදි කරන ලද බතලේගොඩ

වැවේ බිඳී ගිය ස්ථාන ඇය විසින් අලුත්වැඩියා කැරවූ බව ඇයගේ ශිලා ලේඛනයක සඳහන් ව ඇත. (EZ, Vol.10)

චූලවංසයේ සඳහන් තොරතුරු අනුව පැහැදිලි වන්නේ මෙරට වාරි කර්මාන්ත සංවර්ධනයේ උත්කෘෂ්ටතම අවධිය පළමු වන පරාක්‍රමබාහු රාජ්‍ය කාලය වන බව යි. ඔහු විසින් අනුගමනය කරන ලද ක්‍රියා මාර්ග හේතුවෙන් මේ කාලය තුළ දී මෙරට වාරි මාර්ග, පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වූ බව හඳුනා ගැනීමට පිළිවන. විශේෂයෙන් ම සුවිසල් වැව් සඳහා අමතර ජල සම්පාදනයට කටයුතු කිරීම මගින් ඒවා වඩාත් කාර්යක්ෂම කිරීමට කටයුතු කිරීම මගින් කෘෂි කර්මාන්තයේ වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කර තිබෙන බව පැහැදිලි ය. පළමු වන පරාක්‍රමබාහු රජුගේ කාලයේ ඇති වූ ආර්ථික සමාජීය හා ආගමික සමෘද්ධිය උදෙසා රටෙහි ස්වයංපෝෂිත බව ඍජු ව ම බලපා තිබෙන බව පෙනේ. සුවිසල් රජ මාළිගා, වෙහෙර විහාර ගොඩනැගීම පමණක් නොව විදේශ ආක්‍රමණයන් සිදු කිරීමට පවා අවශ්‍ය ශක්තිය හා ධෛර්යය පරාක්‍රමබාහු රජුට ලබාගැනීමට හැකි වූයේ රජු විසින් අනුගමනය කරන ලද වාරි මාර්ග සංවර්ධනය කේන්ද්‍ර කරගත් කෘෂි ආර්ථිකය නගාසිටුවීමේ ක්‍රියාවලිය බව පැහැදිලි ව ම හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකාවට ආවේනික වූ දේශීය වාරි ක්‍රමයක් බිහිකරලීමෙහි ලා භාවිත කරනු ලැබූ තාක්ෂණික ක්‍රම සම්බන්ධයෙන් වූ දැනුම අපගේ පැරණි උරුමය කි. දියුණු තාක්ෂණයෙන් අනූන එවැනි ඉදිකිරීම් සඳහා වූ අවශ්‍ය දැනුම හා මානසික ශක්තිය පුරාණ දේශීය ජනතාවට තිබිණ. අවශ්‍යතාව සපුරා ගැනීම යන සංකල්පය වඩාත් ගැඹුරින් ඉස්මතු වූ අවස්ථාවක් ලෙස පැරණි වාරි කර්මාන්තය දැක්වීමට පුළුවන. ඕනෑ ම ස්ථානයක් සඳහා වාරි ක්‍රමයක් ඉදි කිරීමේදී අවශ්‍යතාව තේරුම් ගැනීමේ නෛසර්ගික හැකියාවන් පැරණි වාරි නිර්මාණ ශිල්පීන් සතු විය. විවිධ අවස්ථාවල රජවරුන්ගේ උපදෙස් හා මෙහෙයවීම මත ක්‍රියාත්මක වූ ශිල්පීහු අවම ශ්‍රමය හා සම්පත් වැය වීමක් මත උපරිම ප්‍රයෝජන ලබාගත හැකි ආකාරයෙන් වැව් අමුණු ඇතුළු විවිධ වාරි ක්‍රම ඉදිකිරීමට කටයුතු කළ හ.

මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ ගංගා නිම්න කිහිපයක් එකිනෙක බද්ධ වූ වාරි කර්මාන්ත ජාලයක් වියළි කලාපයේ බිහි වීම යි. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ අධ්‍යයනය කිරීමට පිළිවන.

1. අමුණු හා ඇළ මාර්ග ආශ්‍රිත තාක්ෂණය.
2. වැව් ආශ්‍රිත තාක්ෂණය.

1. අමුණු හා ඇළ මාර්ග ආශ්‍රිත තාක්ෂණය.

කිසියම් ජල මාර්ගයක ජලය වෙනතකට හරවා යැවීම සඳහා එය හරස් කර පටු හෝ වඩාත් යෝග්‍ය ස්ථානයේ ගොඩනගනු ලබන බැම්ම අමුණක් ලෙස හැඳින්වේ. අමුණක් ආශ්‍රිත ව පවතින ප්‍රධාන ලක්ෂණයක් වන්නේ එහි වම් හෝ දකුණු හෝ ඉවුරින් හෝ දෙකෙන් ම ඇළ මාර්ග ආරම්භ වීම යි. අමුණුවල උපයෝගීත්වය පරීක්ෂා කිරීමේ දී ඒ සඳහා බල පෑ අතුරු අරමුණු ගණනාවක් හඳුනා ගැනීමට හැකි වේ.

අ. වැවකට හෝ වැව් කිහිපයකට අවශ්‍ය ජලය ලබාගැනීම.
ආ. කෘෂි බිම් සඳහා අවශ්‍ය ජලය ලබාගැනීම.
ඇ. වැව්වලට හා කෙත් බිම්වලට එකවිට ජලය ලබාදීම.
ඈ. ජලය අඩු අවස්ථාවල දී රැස් කරගන්නා ජලය එකවිට මුදාහැරීම.
ඉ. දුර බැහැර ප්‍රදේශ කරා ජලය සැපයීම.
ඊ. අන්තර් නිම්න හරහා ජලය රැගෙන යාම.
උ. ධාරිතාව වැඩි කිරීමට අවශ්‍ය ජලය සපයා ගැනීම.

අමුණු සම්බන්ධ තාක්ෂණය

අමුණු ඉදිකිරීමේ දී පුරාණ ශිල්පීන් විසින් විශිෂ්ට තාක්ෂණික හා ශිල්ප ක්‍රම අනුගමනය කර තිබේ. එම නිසා මෙරට පුරාණ අමුණු අපේක්ෂිත කාර්යය ඉටු කරමින් වසර දහස් ගණනක් පුරා ක්‍රියාත්මක තත්ත්වයේ පැවති බව පැහැදිලි ය. පැරණි වාරි ශිල්පීන් විසින් අමුණු ඉදි කිරීමේ දී අවධානය යොමු කළ ක්ෂේත්‍ර කිහිපයක් කි.

(අ) භූමිය තෝරාගැනීම

පුරාණ වාරි කර්මාන්තයේ ප්‍රධාන නිර්මාණයක් වන අමුණ දීර්ඝ කාලයක් ආරක්ෂා වීමට බලපාන ලද ප්‍රධාන සාධකයක් වූයේ අමුණු ඉදිකිරීම සඳහා වඩාත් යෝග්‍ය භූමියක් තෝරා ගැනීම යි. ඉදි කිරීමට අපේක්ෂිත වාරි ක්‍රමය හා භූමිය අතර පැවතිය යුතු සම්බන්ධතාව පිළිබඳ අවබෝධයක් පුරාණ ශිල්පීන් සතු විය. භූමිය තෝරා ගැනීමේ දී ප්‍රධාන අරමුණු දෙකක් කෙරෙහි සැළකිලිමත් වී තිබේ.

1. අමුණු ශක්තිමත් ව ගොඩනැගීමට භූමියෙන් ලැබෙන දායකත්වය.
2. අමුණෙන් ජලය ඇළ මාර්ගවලට යොමු කිරීමේ හැකියාව.

(ආ) ඉදිකිරීමේ මාධ්‍යය

ජලයෙන් ඇති කෙරෙන පීඩනයට ඔරොත්තු දෙන ආකාරයෙන් හා කල් පවතින අයුරින් අමුණක් ඉදි කළ යුතු ය. එබැවින් ඒ සඳහා කල් පවත්නා හා ශක්තිමත් ඉදි කිරීම් මාධ්‍යයක් භාවිත කිරීම කෙරෙහි සැළකිලිමත් වී තිබේ. ඉදි කිරීම් සඳහා යොදා ගත් මාධ්‍ය ගල්, ගඩොල් හා බදාම මූලික වන අතර දැව හා මැටි හෝ බොරලු මිශ්‍රිත පස් භාවිත කරන්නට ඇති බව අනුමාන කළ හැකි ය. දැදුරු ඔයේ පිහිටි සූකර නිජ්ජර අමුණ මල්වතු ඔයේ ගල්කඩවල අමුණ ඉදිකිරීම් සඳහා ගල් යොදා ගත් බවට නිදසුන් වන අතර බදාම භාවිතය සම්බන්ධයෙන් සාධක සූකර නිජ්ජර අමුණෙන් හමු වී ඇත.

(ඇ) නිර්මාණාත්මක ස්වභාවය

අමුණක ශක්තිමත්භාවයට හා කල් පැවැත්මට බලපාන ප්‍රධාන කාරණයක් වන්නේ එහි නිර්මාණාත්මක රටාව ය. විශේෂයෙන් ම මෙවැනි නිර්මාණයක් සැළසුම් කිරීමේදී ජලයෙන් ඇති කරන පීඩනයට ඔරොත්තු දෙන ආකාරයට හා කාන්දු වීම් වැළකෙන ආකාරයට සැළසුම් කළ යුතු ය. ඒ අනුව අමුණක් ඉදිකිරීමේදී එහි උස පළල හා හැඩය කෙරෙහි විශේෂ අවධානය යොමු කර තිබේ. පුරාණ අමුණුවල පවතින විශේෂ ලක්ෂණයක් වන්නේ එය පළලින් වැඩි වීම යි. පීඩනයට ඔරොත්තු දීම හා කාන්දුවීම් වළකා ගැනීම සඳහා අමුණු බැම්ම පළලින් යුතු ව ඉදි කරන්නට ඇත. ගල්කඩවල අමුණ මීටර් 10 කට වැඩි පළලකින් යුක්ත වීම ද සූකර නිජ්ජර අමුණ මීටර් 18 ක පමණ පළලකින් යුතු වීම ද මෙයට නිදසුන කි. අමුණු බැම්ම ඔයේ ඉවුරට හොඳින් කාවදින ආකාරයේ හැඩයකින් යුතු සැළසුමක් යොදා ගෙන තිබෙන බව පැහැදිලි ය.

(ඈ) තාක්ෂණික ලක්ෂණ

අමුණු බැම්ම ශක්තිමත් ව ගොඩනැගීම සඳහා වඩාත් සියුම් තාක්ෂණික ක්‍රමෝපායයන් භාවිත කර තිබේ. ප්‍රධාන ඉදිකිරීම් මාධ්‍ය වශයෙන් ගල් භාවිත කරන අමුණක පවතින අභියෝගයක් වන්නේ එම ගල් ශක්තිමත් ලෙස එකිනෙක සම්බන්ධ කරලීම යි. ඒ සඳහා වැද්දුම් ක්‍රම ගණනාවක් යොදාගත් බවට සාක්ෂි වේ. එහෙත් එම ක්‍රම වඩාත් ම උචිත ම ස්ථානයට යොදා ගැනීම

ශිල්පීන්ගේ හැකියාව පෙන්නුම් කරන්නකි. භූමියේ ස්වාභාවික ගල් තලා මත කපන ලද කැපුම් තුළට ගල් කුට්ටි හිර කිරීම මඟින් අමුණ පහළට තල්ලු වී යාම වළක්වා ඇත. ගල් කුට්ටිවල කට්ටා කැපීම, කුඩුම්බි යෙදීම හා කප්පිලි යෙදීම මගින් ගල් එකිනෙක සම්බන්ධ කර ඇත.

2. වැව් ආශ්‍රිත තාක්ෂණය.

කෘෂි කර්මාන්තය වඩාත් සංවිධානාත්මක ලෙස කිරීමට අවශ්‍ය ජලය ලබාගැනීම වැවක් ඉදිකිරීමේ මූලික අරමුණු විය. වියළි කලාපීය කෘෂි කර්මාන්තයේ පදනම වූයේ වැව යි. ඒ අනුව "ගමට වැවක් " යන සංකල්පය වියළි කලාපීය ප්‍රදේශවලට බෙහෙවින් සාධාරණ අදහස කි. වර්තමානයට වඩා පුරාණයේ දී වියළි කලාපීය ජනාවාසකරණය වැව් ආශ්‍රිත ව වැඩියෙන් සිදු වී ඇත. මේ නිසා ඔවුන්ට වැව සම්පත් දායකයෙකු ලෙස කටයුතු කර තිබෙන බව පැහැදිලි ය.

වැව යනු ජලය රැස් කරන ප්‍රධාන මධ්‍යස්ථානය කි. එබැවින් වැවක් ඉදිකිරීමේ දී එයට ජලය ලබා ගන්නා මාර්ග පිළිබඳ ව පූර්ණ අධ්‍යයනයක් කළ යුතු වේ. වැවකට ජලය ලබා ගන්නා ප්‍රධාන ක්‍රම දෙක කි

1. එක් නිම්නයක සිට තවත් නිම්නයකට ජලය හරවා රැගෙන ගොස රැස්කර ගැනීම.
2. පෝෂක ප්‍රදේශය හරහා බැම්මක් ඉදිකර ජලය රැස්කර ගැනීම.

ප්‍රධාන ද්විතීයික හා තෘතීයික නිම්නවල තිබෙන ජලය රැස්කර ගැනීම පිණිස එම නිම්න හරහා බැම් බැඳ වැව් තැනීම පුරාණයේ සිට ම පැවතෙන ක්‍රමය කි. ධාතුසේන රජු කලාඔය හරස් කර කලා වැව ඉදිකිරීම මෙයට නිදසුන කි. මෙම ක්‍රමය තුළ ඉදි කළ ඇතැම් වැව් සඳහා ජලය ලබා ගන්නා ක්‍රමය භූමියේ ස්වභාවය අනුව වෙනස් වේ. පෝෂක ප්‍රදේශයේ ජලය රැස් කර ගැනීමේ අභිලාෂයෙන් ආකාර කිහිපයකට කුඩා වැව් ඉදිකර ඇත.

අ. කුඩා ජල මාර්ග හෙවත් අගාර සහිත පහත් භූමියක බැම් බැඳ වැව ඉදිකිරීම. මෙම ක්‍රමයේ දී අගාරවලින් එන ජලයෙන් වැව පිරවීම කළ හැකි ය.

ආ. පෝෂක ප්‍රදේශයට ලැබෙන වැසි ජලයෙන් පිරෙන පරිදි වැව ඉදි කිරීම. මෙම ක්‍රමය කොටු වැව් සඳහා වඩාත් යෝග්‍ය වේ.

ඇ. ඉහළ ප්‍රදේශයේ පිහිටි වැව්වලින් එන පිටාර ජලය රැස් කර ගැනීම සඳහා ඊට පහළින් වැව ඉදිකිරීම.

වැවකින් අපේක්ෂා කරන මූලික අරමුණු ඉටු වන ආකාරයෙන් එහි තාක්ෂණික අංග සැළසුම් කර තිබෙන බව පැහැදිලි ය. වැවක ප්‍රධාන තාක්ෂණික අංග වැවකින් සිදු වන ප්‍රධාන කාර්යයක් හා ඍජුව ම සම්බන්ධ වේ. වැවක් ඉදිකිරීමේ දී වැවේ කාර්යක්ෂමතාව උපරිම අයුරින් ඉටු වන ආකාරයට එම තාක්ෂණික අංග ස්ථානගත කිරීම කෙරෙහි පුරාණ ශිල්පීන් විශේෂ අවධානයක් යොමු කර ඇත.

1.) ජලය රැස්කිරීම.

වැවකින් සිදුවන ප්‍රධාන කාරණයක් වන්නේ විශාල ජල ප්‍රමාණයක් රැස් කර රඳවා ගැනීම යි. ඒ සඳහා දායක වන ප්‍රධාන ම තාක්ෂණික අංගය වන්නේ වැව් බැම්ම ය. වැව් බැම්ම ඉදිකිරීමේ දී භූමියේ තිබෙන උස් ස්ථාන සමඟ එය සම්බන්ධ කිරීමෙන් එහි ආරක්ෂාව කෙරෙහි සැළකිලිමත් වී තිබේ. බැම්ම ඉදිකිරීමේ දී පොළොව තරමක් යටට හාරා එතැන් සිට මැටි හා බොරලු මිශ්‍ර පස් ස්ථර ආකාරයෙන් යොදා තලමින් එහි ශක්තිමත්භාවය ගොඩනගා ඇත. ඇතැම් විශාල වැව්වල බැම්මේ මැදට දැඩි පීඩනයක් තුළ බොරලු ස්ථරයක් න්‍යෂ්ටියක් සේ යොදා එහි කාන්දු වීම් වළක්වාලීමට කටයුතු කර ඇති බව පෙනේ. ජලයෙන් වැව් බැම්ම සේදී යාම වැළැක්වීම සඳහා යොදන ලද තාක්ෂණික අංගය වූයේ "රළපනාව" ය. පුරාණ රළපනාව ක්‍රමානුකූල ව අසුරන ලද ගල් කුට්ටිවලින් යුතු බව පදවිය වැවේ පුරාණ රළ පනාවෙන් තහවුරු වේ.

2.) ජල කළමනාකරණය.

වැවක රැස් කරන ජලය නිසි කළමනාකරණයක් යටතේ කෙත්බිම් කරා බෙදා හැරීම වැදගත් කාර්යය කි. රැස්කර ගන්නා ජලය අවශ්‍ය තැනට අවශ්‍ය ප්‍රමාණයට හා නිසි වේලාවට බෙදා හැරීම ජල කළමනාකරණය නම් වේ. මේ සඳහා සකස්වුණු නෛතික ක්‍රියාවලියක් සෑම වැවක් උදෙසා ම පුරාණයේ දී ක්‍රියාත්මක වන්නට ඇත. සිව් වන මිහිඳු රජුගේ වෙස්සගිරි ශිලා ලේඛනයේ තිසා වැවෙන් ජලය නිකුත් කිරීම පිළිබඳ නීති රීති දක්වා තිබීම මෙයට නිදසුන කි.

වැවකින් ජලය නිකුත් කිරීම සඳහා භාවිත කළ දියුණු තාක්ෂණික අංගය සොරොව්ව ලෙස හඳුන්වනු ලබයි. පුරාණයේ දී මෙය ප්‍රණාලිකා ලෙස හඳුන්වා ඇත. විශාල වැව්වල ගොඩ සොරොව්ව හා මඩ සොරොව්ව නමින් වර්ග දෙකක සොරොව් තිබුණු අතර කුඩා වැව්වල කැට සොරොව්ව නම් කුඩා සොරොව් විශේෂයක් විය. ගොඩ සොරොව්වෙන් වඩා ඇත

ප්‍රදේශවල කෙත් බිම්වලට ද මඩ සොරොව්වෙන් මෑත කෙත් බිම්වලට ද ජලය නිකුත් කරන්නට ඇති බව පැහැදිලි ය. බිසෝ කොටුව සොරොව්ව ආශ්‍රිත ව තිබුණු විශිෂ්ටතම තාක්ෂණික අංගය යි. වැවේ ජලය වැව් බැම්මට හානියක් ඇති නොවන ආකාරයට පාලනය කරමින් නිකුත් කළ ප්‍රධාන ම මෙහෙයුම් ස්ථානය වූයේ බිසෝකොටුව ය. වැවේ ජලය නිකුත් කිරීමේ දොරටුව මේ ආශ්‍රිත ව තිබෙන්නට ඇත. ජලය බිසෝකොටුවට ගෙන ඒම හා එහි ජලය පිටතට මුදා හැරීම ගල් පුවරුවලින් සකස්කළ නල මාර්ග වැව් බැම්ම යටින් යොදා ඇත. එහි ගලායන ජලය බැම්මට උරා ගැනීම වැළැක්වීම සඳහා නල මාර්ගය වටා ගඩොල් ආස්තරණයක් යොදා තිබෙන බව හු වැව සොරොව්වෙන් තහවුරු වී ඇත. සොරොව්වෙන් නිකුත් කරන ජලය ක්ෂේත්‍රයට ගෙන යන්නේ ඇළ මාර්ග මගිනි. මාතිකා නමින් හඳුන්වන මෙවැනි ඇළ මාර්ග විශාල සංඛ්‍යාවක් පිළිබඳ ව වංශකථාවෙහි සඳහන් වේ.

3.) අතිරික්ත ජලය පිටකිරීම.

වැවක් එහි උපරිම මට්ටම ජලයෙන් පිරුණු පසු එහි රැස්වන අතිරික්ත ජලය පිට කිරීමට කටයුතු යෙදීම වැවේ ආරක්ෂාවට බෙහෙවින් වැදගත් වන්න කි. මෙය වැව් බැම්මේ ආරක්ෂාවට තදින් ම බලපාන කාරණයක් වේ. මේ සඳහා වැව්වල ඉදිකරන ලද තාක්ෂණික අංගය පිටවාන හෙවත් පැන්නුම, මදව්ව හා තලව්ව යන නම් වලින් හඳුන්වා ඇත. වාරි සම්පාතය ලෙස පුරාණයේ දී හඳුන්වා ඇත්තේ මෙයයි. පිටවාන පිහිටා ඇත්තේ වැවේ මට්ටමට වඩා පහළිනි. එවිට බැම්ම මතින් ජලය ගලාගෙන ගොස් බැම්මට හානිවීම වළක්වා ගත හැකි ය. වාන අසළ වැව් බැම්මේ ඉවුරු දෙක ගල් අතුරා ආරක්ෂා කර ඇත්තේ සේදී යාම පාලනය කිරීමට බව පෙනේ. අතිරික්ත ජලය වෙනත් වැවකට හෝ වෙනත් ජල මාර්ගයකට යොමුකරන ඇළ මාර්ග වාන් ඇළ ලෙස හඳුන්වනු ලැබේ.

වියළි කලාපීය ගංගා නිම්නාශ්‍රිත ව ගොඩනගා තිබෙන වැව් අමුණු හා ඇළ මාර්ගවලින් සැදුම් ලත් වාරි කර්මාන්ත ජාලය ඉතාමත් කාර්යක්ෂ ම ව ක්‍රියාත්මක වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ වාරිනිර්මාණ ශිල්පීන් සතු ව පැවති අදාළ විෂය සම්බන්ධයෙන් වන අත්දැකීම් මූලික වූ දැනුම බව පැහැදිලි ය. භූමිය තෝරා ගැනීමේ සිට වාරි නිර්මාණය ගොඩනැගීම තෙක් පමණක් නොව එය ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පවා ඔවුන්ගේ දැනුම ඒ සඳහා භාවිත වූ බව පැහැදිලි ය. එය අනුරාධපුර හා පොළොන්නරු යුගවල ශක්තිමත් කෘෂි ආර්ථික රටාවක් ඇති කිරීමට ත් ශ්‍රී

ලංකාවේ සමෘද්ධිමත් භාවය වැඩිදියුණු කිරීමට ත් බෙහෙවින් ම ඉවහල් වූ බව පැහැදිලි ය.

වියළි කලාපයේ වාරි පද්ධතිය බිඳවැටීමට තුඩු දුන් ප්‍රධාන හේතුව ලෙස සැළකිය හැක්කේ දේශපාලන අස්ථාවරත්වය නිසා වාරි කර්මාන්තයට තිබුණු රාජ්‍ය අනුග්‍රහය නොලැබීමෙන් ඒවා නිසි පරිදි නඩත්තු නො වීම ය. ඒ සමග ම ජනතාව මෙම ප්‍රදේශ අතහැර සුවිසල් වාරිමාර්ග කටයුතු අනවශ්‍ය වූ නිරිතදිග තෙත් කලාපයට සංක්‍රමණය වීම සිදු විය. මේ හේතුවෙන් ප්‍රදේශය ජනශූන්‍ය වූ අතර ඉතිරි වූ කුඩා ජන කණ්ඩායම් සඳහා තම කෘෂිකාර්මික අවශ්‍යතා සපුරා ගැනීම පිණිස කුඩා වාරි ක්‍රම ප්‍රමාණවත් වන්නට ඇත. විශාල වාරි මාර්ග නඩත්තු කිරීමේ ශක්තියක් එම ජනතාවට නොමැති වීමෙන් ඒ කෙරෙහි පැවති අවධානය ක්‍රමයෙන් අඩු වී යාම නිසා මෙම ඉදිකිරීම් ක්‍රමයෙන් දුර්වල වන්නට ඇති බව අනුමාන කළ හැකි ය. පශ්චාත් කාලීන ව එළඹි විවිධ ස්වභාවික විපත් හා මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ලෙස මෙම වාරි පද්ධතියේ සුවිශේෂී ඉදිකිරීම් විනාශ වී යන්නට ඇත.

රටේ සංවර්ධනය සඳහා යා යුතු නිවැරදි දිශානතිය අවබෝධ කර ගෙන සිටින වත්මන් රජය එහි එක් පියවරක් ලෙස විනාශ වී ගිය වාරි පද්ධතියේ සුවිශේෂී ඉදිකිරීම් යළි ප්‍රතිසංස්කරණය කිරීමට ත් නව වාරි ක්‍රම ගොඩනැගීමට ත් කටයුතු කරමින් සිටී. ගල් අමුණ, වෙහෙරගල වැනි ජලාශ ඉදිවූයේ ද, දැදුරු ඔය, රඹකැන් ඔය, උමා ඔය සහ මොරගහකන්ද වැනි සුවිසල් වාරි ක්‍රම ඉදිවෙමින් පවතින්නේ ද ශ්‍රී ලංකා රජයේ වත්මන් නායකත්වයේ දූරදර්ශී බවේ ප්‍රතිපලයක් ලෙසිනි.

**මූලාශ්‍රය**


| | |
|---|---|
| ගයිගර්, ඩබ්. | -1969, මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය, (පරිවර්තනය) කොළඹ. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. |
| තෙන්නකෝන්, එම්.යූ.ඒ. | -2005, වියළි කලාපීය පරිසරානුගත සංවර්ධනයක් සඳහා එල්ලංගාව. කොළඹ. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. |
| ධීරානන්ද හිමි, එච්. | -2004, රාජ්‍යත්වය, රාජ්‍යය සහ ආගම, වරකාපොල. ආරිය ප්‍රකාශකයෝ. |
| නිකොලස්. සී.ඩබ්. | -1959, මහා පරාක්‍රමබාහු රජතුමාගේ වාරි කර්මාන්ත. පොළොන්නරු යුගය. (සංස්කරණය) දෙහිවල, තිසර ප්‍රකාශකයෝ. |
| නිකොලස්, සී.ඩබ්. | -1961, පුරාණ වාරි මාර්ග ක්‍රම. අනුරාධපුර යුගය. (සංස්කරණය) කැලණිය. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, |
| නිකොලස්, සී.ඩබ්. | -1979. පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය. (පරිවර්තනය) දෙහිවල. රාජකීය ආසියාතික සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) තිසර ප්‍රකාශකයෝ. |

| | |
|---|---|
| පීරිස්, ආර්. | -1964 (2001) සිංහල සමාජ සංවිධානය. (පරිවර්තනය) බොරලැස්ගමුව, විසිදුණු ප්‍රකාශකයෝ. |
| පූජාවලිය | -1961, (සංස්.) සූරවීර ඒ.වී. කොළඹ. |
| බස්නායක, එච්.ටී. | -1997, පුරාණ ශ්‍රී ලංකාවේ ජලජ ශිෂ්ටාචාරය, කොළඹ. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. |
| බස්නායක, එච්.ටී. | -2001, ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 1, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. |
| බ්‍රෝහියර්, ආර්.එල්. | -2002, ලක්දිව පුරාතන වාරි මාර්ග, (පරිවර්තනය) කොළඹ, මහවැලි කේන්ද්‍රය. |
| මහාවංසය | -1967. (සංස්.) සුමංගල හිමි, බටුවන්තුඩාවෙ. කොළඹ. |
| මහවැලි වංශය | -1984. කාණ්ඩය 1 හා 2. කොළඹ. මහවැලි සංවර්ධන අමාත්‍යාංශය. |
| රණවැල්ල. එස්. | -2004, සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය. කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. |
| රාජාවලිය | -1997. (සංස්.) සූරවීර ඒ.වී. කොළඹ. |
| . | ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය -1964 (2000) කාණ්ඩය භාගය කැලණිය. කැලණිය විශ්වවිද්‍යාලය. |
| විජයසූරිය, ඩබ්. | -1990\91. සිංහල කෘෂි වාරි කර්මාන්ත ඉතිහාසයේ නොවිසඳුණු ගැටලු කිහිපයක්. කොළඹ, රාජකීය ආසියාතික සංගමය. |
| සිරිවීර. ඩබ්. අයි. | -2001, රජරට ශිෂ්ටාචාරය හා නිරිතදිග රාජධානිය, කොළඹ. දයාවංශ ජයකොඩි සහ සමාගම. |
| Arumugam, S | 1969, Water Resources of Ceylon, Colombo, Water Resources Board |
| Brohier, R.L. | 1934 ( 1979 ) – Ancient Irrigation Works in Ceylon. Part I – II, Colombo. The Ministry of Mahaweli Development. |
| Cooray. , P.G. | 1967 ( 1984 ), An Introduction to the Geology of Sri Lanka, Colombo, National Museum. |
| Epigraphiya Zeylanica | 1912, Vol I, (ed). D.M.D.Z Wickramasingha, London, Oxford University Press. (EZ) |
| Epigraphiya Zeylanica, | 1928, Vol. II, (ed) D.M.D.Z Wikcramasingha, London, Oxford University Press. (EZ) |
| Epigraphiya Zeylanica, | 1933, Vol. III, (ed.) S. Paranavitana, London, Oxford University Press. (EZ) |
| Epigraphiya Zeylanica, | 1943, Vol. III, (ed.) S. Paranavitana, London, Oxford University Press. (EZ) |
| Epigraphiya Zeylanica, | 1955, Vol. V (ed.) S. Paranavitana, Colombo, Department of Archaeology |
| Inscription of Ceylon | 1970, Vol. I, (ed.) S. Paranavitana, Colombo, Department of Archaeology. |
| Inscription of Ceylon | 1983, Vol. II Part I, ed. S. Paranavitana, Colombo, Department of Archaeology. (IC) |
| Nicholas., C.W. | 1959, A Short Account of the History of Irrigation Works Up to the 11th Century, Journal of Royal Asiatic Society (N.S), Vol VII. I, Pp 43 – 64. |
| Paranavitana. S. | 1958, Some Regulation Concerning Village Irrigation Works in Ancient Ceylon, The Ceylon Journal of Historical and Social Studies. 1(1), Pp 1–7. |
| Parker. H. | 1889, Irrigation in the North Western Province, Report on the Proposed Deduru Oya Project, Vol. III, Colombo, Government Printer. |